# දැන්වීමයි

# උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**<u>උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම (සීමිත) - 2021</u>**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.11.15 වන අතර බඳවා ගැනීමේ තරඟ විභාගය 2021 දෙසැම්බර් මස අනුරාධපුර නගරයේදී පැවැත්වීමට නියමිත වේ.

02. තනතුරකට බඳවා ගැනීමේදී පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.

| | තනතුර | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|
| i. | කාර්මික නිලධාරි (සිවිල්) iii ශ්‍රේණිය | - 15 |
| ii. | කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක) | |
| iii. | කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙ වසරක) | |

03. **සුදුසුකම්:**

3.1 **පොදු සුදුසුකම්**

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම සුදුසු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

III. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

IV. පත්වීම ස්ථිර කර තිබිය යුතුය

3.2 **අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම්:-**

(අ) සියළුම තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්:-

භාෂාව, ගණිතය හා විද්‍යාව යන විෂයයනට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින්(06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

**<u>(ආ)තාක්ෂණික සුදුසුකම්</u>**

**<u>I.කාර්මික නිලධාරී iii ශ්‍රේණිය (සිවිල්)</u>**

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරි නමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා ( NVQ 6 ) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම

**<u>II.කාර්මික නිලධාරී(සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය(එක් වසරක)</u>**

I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම(උදාහරණ:- ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්/විදුලි/යාන්ත්‍රික))

හෝ

II. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම

හෝ

III. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

හෝ

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම

**<u>III.කාර්මික නිලධාරී(සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය(දෙ වසරක)</u>**

තාක්ෂණික සුදුසුකම් අදාළ නොවේ.

**<u>(ඈ) පළපුරුද්ද</u>**

**<u>I.කාර්මික නිලධාරී iii ශ්‍රේණිය (සිවිල්)</u>**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

**<u>II.කාර්මික නිලධාරී(සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය(එක් වසරක)</u>**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

**<u>III.කාර්මික නිලධාරී(සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය(දෙ වසරක)</u>**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

**<u>සටහන:-ඉහත 3:2 (ඇ) හි කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක) යටතේ අයදුම්කරන අයදුම්කරුවන් 1990.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 හි අවශ්‍යතා සපුරා ඇති විටදී කාර්මික නිලධාරී iii ශ්‍රේණිය (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීම සලකා බලනු ලැබේ.</u>**

ඉහත 3:2 (අ) හි අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් උතුරු මැද පළාත තුළ නොමැති වුවහොත් පමණක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 හි විධි විධාන අදාළ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**04. වැටුප් ක්‍රමය:**

(අ) තාක්ෂණ සේවයේ iii ශ්‍රේණියේ තනතුරු සඳහා හිමි වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව වැටුප් කේත අංක MN3–2016 යටතේ රු.31,040-445x10-660x11-730x10-750x10-57,550/= වේ. ඊට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනා රු 7800/= ක් සහ විශේෂ දීමනා රු.2500/= ක් මාසිකව ගෙවනු ලැබේ.

(ආ) පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා බඳවා ගන්නා ලද ආධුනිකයින් පුහුණු කිරීමේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර පුහුණු පාඨමාලාව අවසානයේ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වන විභාගයෙන් සමත් වන තුරු උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ බඳවා ගැනීම් ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාල සීමාව සතුටුදායක ලෙස ගතකරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ.

**05 . සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

**කාර්මික නිලධාරී iii ශ්‍රේණිය (සිවිල්) තනතුරු සඳහා**

(අ) මෙම තනතුරු ස්ථිරය.

(ආ) පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වනු ඇත.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**කාර්මික නිලධාරී(සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා(එක්වසරත/දෙවසරක)**

(අ) කාර්මික නිලධාරී(සිවිල්) iii ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට ප්‍රමාණවත් නොවන විට ඉහත 02 ඡේදයේ දක්වා ඇති පරිදි ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් අනුව එක් අවුරුදු හා දෙ අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා බඳවා ගනු ලැබේ.

(ආ) නියමිත පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන විභාගයෙන් සමත්වන අය පමණක් කාර්මික නිලධාරී තනතුරට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**06. තෝරාගැනීමේ ක්‍රමය**

මේ සඳහා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ලකුණු කුසලතාවය හා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර, මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරයි. ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සළකා බලනු නොලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු

ලබාගත් අයදුම්කරුවන් , ඔවුන්ගේ සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගනු ලැබේ.

**07.** **විභාග ක්‍රමය:**

තරඟ විභාගය පහත සඳහන් පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය :කාලය පැය 01යි. - ලකුණු 100.
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය : කාලය පැය 03 යි - ලකුණු 100

**විෂයය නිර්දේශය**

**තාක්ෂණ සේවයේ සියලුම තනතුරු සඳහා බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. සියලුම තනතුරු සඳහා වන අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා 40% හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

**විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය**

(අ) තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියේ /පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා

සිවිල් නිලධාරියකුට තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජලාපවහන සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. සමත්වීම සඳහා 40%ක් හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

**08.** **විභාගය පැවැත්වීමට යෝජිත නගර:**

විභාග මධ්‍යස්ථාන අනුරාධපුර නගරයේ පමණක් පිහිටුවීමට යෝජිතය.

**09.** **භාෂා මාධ්‍යය:**

විභාගය සිංහල, දෙමළ, භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**10.** **අයදුම්පත්‍ර:**

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී 21x30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහිද, අංක 04 සිට 07 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව සම්පූර්ණ කළ යුතුය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.11.15 **දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර"** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ .................(තනතුරු නාමය)................ සඳහා බඳවා ගැනීම(සීමිත) - 2021"** යන්න සඳහන් කළ යුතුය. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(ඇ) ඉල්ලුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඈ) අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර වෙනත් ස්ථානවලට මුදල් ගෙවූ රිසිට්පත් සහිත අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන

අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් ඇතිවන ගැටළු පිළිබඳව මෙම ආයතනය වගකියනු නොලැබේ.

(ඊ) අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර අදාළ අයදුම්පත් ආවරණ ලිපියක් සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

**11.** **විභාග ගාස්තු:**

(අ) මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු. 600.00 ක මුදලක් උතුරු මැද පළාත් සභාවේ ආදායම් ශීර්ෂ අංක 2003.02.13 ට බැර වන පරිදි ( එන්සී 100 ආකෘතිය මඟින් ) **උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය.** ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. **මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ** විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් බාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල්ද භාරගනු නොලැබේ.

(ආ) 2021.10.15 දිනට මෙම විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති , නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඇ) විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07කට කලින් විභාග ප්‍රවේශපත් නොලදහොත් එම අයදුම්කරුවන් පහත සඳහන් විස්තර ඇතිව දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලියා දැන්විය යුතුය.

i. විභාගයේ නම
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම
iii. රාජකාරි ලිපිනය
iv. ඉල්ලුම්පත් යොමු කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය

**12.** **සාවද්‍ය තොරතුරු සැපයීම:**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහුගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

**13.** විභාගය පවත්වන දිනය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථා කාලයේදී දැනුම් දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියමකළ පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී. මෙම විභාගය පැවැත්වීම , පත්වීම ලබා දීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

**14.** බඳවා ගැනීමේ කොන්දේසි, තනතුරට අදාළ වන උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව තීරණය වේ.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත .
2021.10.01